# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය
# මාර්ග සංවර්ධන අධිකාරිය

# ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත්භාර අධ්‍යක්ෂ (ද.ප) කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා ඇස්පෝල්ට් (Asphalt) ලබා ගැනීම සඳහා මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | දිස්ත්‍රික්කය | ලංසු ඇපකරය |
|---|---|---|---|
| 01 | මාර්ග සංවර්ධන අධිකාරියේ මාතර විධායක ඉංජිනේරු කොට්ඨාශයේ කි.මී. 100,000 විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ඇස්පෝල්ට් (Asphalt) සැපයීම. RDA/SP/EEM/LBRRP/ASP/2023/02 | මාතර | 250,000.00 |

02. මිළ ගණන් කැඳවීම ජාතික තරගකාරී ලංසුකරන පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

03. මිළ ගණන් පත් ගෙවීමකින්තොරව “පළාත් භාර අධ්‍යක්ෂ (දකුණු පළාත), මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර” වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

04. මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් 2023.08.28 දින සිට 2023.09.11 දින දක්වා පෙ.ව.09.00 සිට ප.ව 03.00 දක්වා කාලය තුළ එක් මිළ ගණන් පතක් සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 1,500.00 (සියලු බදු රහිත) ගාස්තුවක් බැගින් සහ ලිඛිත අයදුම්පතක් “පළාත් භාර අධ්‍යක්ෂ (දකුණුපළාත) මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර” වෙත ඉදිරිපත් කිරීමෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාල අයදුම්පත් ලබාගත හැකිය.

05. සම්පූර්ණ කළ මිළගණන් පත් 2023.09.12 දින ප.ව. 02.00 ට පෙර “පළාත් භාර අධ්‍යක්ෂ (දකුණු පළාත)” මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර යන ලිපිනයට එවීම හෝ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදුකළ යුතුය. ප්‍රමාදවී ලැබෙන මිළ ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ එකී මිළ ගණන් විවෘත කරනු ලැබේ.

06. ඔබගේ මිළ ගණන් පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරෙහි “මාතර විධායක ඉංජිනේරු කොට්ඨාශය සඳහා ඇස්පෝල්ට් සැපයුම් කිරීම- කි.මී. 100,000 වැඩ සටහන”යනුවෙන් සඳහන් කළ යුතුය.

07. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් දක්වා ලංසුව වලංගු විය යුතුය. ලංසුව ලංසු ලේඛනයේ සඳහන් කොට ඇති ප්‍රමාණයේ ලංසු ආරක්ෂණයකින් (ලංසු වලංගු කාලයේ සිට තවත් දින 28 ක් දක්වා වලංගු) සමන්විත විය යුතුය.වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු පළාත්භාර අධ්‍යක්ෂ (ද.ප), පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර වෙතින් ලබා ගත හැක. දු.ක. 041-2222150/041-2226109

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව**
**පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (දකුණු පළාත)**
**මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර**